# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1984/5 - 2016 සැප්තැම්බර් මස 13 වැනි අඟහරුවාදා - 2016.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ 2016 අංක 03 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

2016.08.23 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2016.08.29 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

***සබරගමුව පළාත් සභාවේ 2016 අංක 03 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය***

2016.06.14 වන දින සභා සම්මත කරනු ලදුව 2016.08.29 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2016 අංක 03 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පාලිත නානායක්කාර,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**සබරගමුව පළාතේ පළාත් සභාව**

2015 අංක 03 දරන විසර්ජන සංශෝධන හා 2015 අංක 07 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්තිවලින්
සංශෝධිත 2014 අංක 10 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ

විසර්ජන ප්‍රඥප්තිය

2016

2015 වර්ෂය සඳහා

**2015 අංක 03 දරන විසර්ජන සංශෝධන හා 2015 අංක 07 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්තිවලින් සංශෝධිත 2014 අංක 10 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය**

01. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2016 අංක 03 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

02. 2014 වර්ෂයේ අංක 10 දරන විසර්ජන ප්‍රඥප්තියෙහි දෙවන උප ලේඛනයෙහි සඳහන් 81101, 84101, 85301, 81202, 83102 යන අත්තිකාරම් ගිණුම්වල සීමාවන්, මෙහි පළමු උපලේඛනය පරිදි සංශෝධනය කරනු ලැබේ.

*පළමු උපලේඛනය*

**2015 ඇස්තමේන්තු**

**පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු හා වෙනත් අත්තිකාරම් ගිණුම් කටයුතු**

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු* | *විෂය අංකය* | *අත්තිකාරම් වර්ගය* | *උපරිම වියදම් සීමාව* | *අවම ලැබීම් සීමාව* | *හර ශේෂයේ උපරිම සීමාව* | *බැරකම්වල උපරිම සීමාව* |
| **වෙනත් අත්තිකාරම් ගිණුම්** | | | | | | | |
| 9 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 81101 | පළාත් රා : නි : අත්තිකාරම් | 300,000,000.00 | 125,000,000.00 | 415,000,000.00 | - |
| 19 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 84101 | පළාත් රා : නි : අත්තිකාරම් | 798,945,000.00 | 316,000,000.00 | 950,000,000.00 | - |
| 23 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 85301 | පළාත් රා : නි : අත්තිකාරම් | 10,153,385.00 | 4,500,000.00 | 19,350,000.00 | - |
| 30 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 81202 | පින්නවල පංචකර්ම මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම | 2,800,000.00 | 1,500,000.00 | 940,000.00 | 400,000.00 |
| 33 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 83102 | පේෂකර්ම වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 25,019,000.00 | 10,000,000.00 | 5,000,000.00 | 2,000,000.00 |

09 - 975

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.